For More Past Papers
www.tamilguru.lk

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වැනි පන්තියේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014(2015)

(i) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ලිඛිත පරීක්ෂණය

පැ. දෙකයි

විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.



*** පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

1 2 3 4

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන හා පස්වන පිටුවල ඇති තිත් ඉරි මත ද ලියන්න.

....

නිවැරදි බවට නිරීක්ෂකගේ
කෙටි අත්සන

....

වැදගත් :

* මෙම ප්‍රශ්න පත්‍රය පිටු **11** කින් හා ප්‍රශ්න **75** කින් යුක්ත වේ.
* පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.
* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය **පැය දෙකකි.**
* ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.
* **දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.**
* **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
* ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත්‍ර ශාලාධිපතිට භාර දිය යුතුය.
* ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස **නිල් හෝ කළු** පෑනෙන් පමණක් ලියන්න. **පැන්සල් පාවිච්චි නොකරන්න.**
* මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.
* **අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

පිටුව	ප්‍රශ්න අංකය	ලැබූ ලකුණු
2	1 - 9	
3	10 - 20	
4	21 - 28	
5	29 - 37	
6	38 - 45	
7	46 - 54	
8	55 - 61	
9	62 - 66	
10	67 - 72	
11	73 - 75	
එකතුව		

අවසාන ලකුණු

ඉලක්කමෙන්	
අකුරින්	

උත්තර පත්‍ර පරීක්ෂක	
ලකුණු පරීක්ෂා කළේ	

[2 වැනි පිටුව බලන්න.

For More Past Papers
www.tamilguru.lk

- අංක 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න.

1. පරිගණකයක අත්‍යවශ්‍ය උපාංගයක් නොවන්නේ මින් කුමක් ද?
   (1) Monitor (2) CPU (3) CD-ROM (4) Memory (.........)

2. ප්‍රධාන මතකයේ (main memory) ආචයන ධාරිතාව, සත්‍ය ධාරිතාව ඉක්මවා ඉහළ නංවන ක්‍රමය කුමක් ද?
   (1) multitasking (2) virtual storage
   (3) multiprocessing (4) switching (.........)

3. ආදාන මෙන්ම ප්‍රතිදාන උපාංගයක් ලෙස භාවිත කළ හැක්කේ පහත කවරක් ද?
   (1) යතුරු පුවරුව (2) ස්පර්ශ සංවේදී තිරය
   (3) සුපරීක්ෂකය (scanner) (4) මවුසය (.........)

4. මෘදුකාංග ස්ථාපනය කරන විට (install) අවශ්‍ය සංරචක පමණක් තෝරා ගැනීමට අවකාශ සලසන්නේ කුමන ස්ථාපන විකල්පය ද?
   (1) Typical (2) Portable (3) Full (4) Custom (.........)

5. "මෘදුකාංගයක් යනු, කළයුතු කාර්යය කුමක් ද යන්න .... වෙත උපදෙස් දෙන ඕනෑම .... කි."
   මෙම ප්‍රකාශයේ හිස්තැන් පිරවීමට වඩාත්ම සුදුසු වචන දෙක පිළිවෙළින් ඇතුළත් යුගලය මින් කුමක්ද?
   (1) වැඩසටහන, උපාංගය (2) ක්ෂේත්‍රය, දෘඪාංග
   (3) උපදේශය, මධ්‍ය සැකසුම් ඒකකය (4) උපදෙස් මාලාව, දෘඪාංග (.........)

6. මුද්‍රණ ලැයිස්තුවක (print queue) ඇතුළත් වන්නේ .... ලැයිස්තුවකි.
   (1) එම මුද්‍රණ යන්ත්‍රය භාවිත කිරීමට අවසර ඇති සියලු පරිශීලකයන්ගේ
   (2) දිනය තුළ කාර්යාලයේ භාවිත කරන ලද මුද්‍රණ යන්ත්‍රවල
   (3) සියලු පරිශීලකයන් විසින් මෙම මුද්‍රණ යන්ත්‍රය භාවිත කරමින් මුද්‍රණය කිරීමට විධාන කර ඇති ලේඛනවල
   (4) දිනය තුළ එම මුද්‍රණ යන්ත්‍රයෙන් මුද්‍රණය කළ ලේඛනවල (.........)

7. පරිගණකයේ මව්පුවරුවේ බැටරිය දෝෂ සහිත බව දැක්වෙන්නේ පහත කවරක් මගින් ද?
   (1) මෙහෙයුම් පද්ධති මුරපද (system passwords) අක්‍රිය වේ.
   (2) දෘඪ තැටියේ ඇති ගොනුවල විකෘති හෝ හානි සිදුවේ.
   (3) අතථ්‍ය මතකයේ (virtual memory) සැකසුම්, පෙරනිමි (default) අගයයන්ට වෙනස් කෙරේ.
   (4) ප්‍රවර්තන දිනය හා වේලාව පෙරනිමි අගයයන්ට වෙනස් කෙරේ. (.........)

8. ස්විචයක් (switch), නාභියකට (hub) වඩා වාසිදායක වන්නේ පහත කවරක් නිසා ද?
   (1) ජාල තදබදය (network traffic) අඩු කිරීම
   (2) වෛරස පැතිරීම වැළැක්වීම
   (3) අන්තර්ජාලයට සෘජුව පරිගණකය සම්බන්ධ කිරීම
   (4) වැඩ නිකේතනයෙහි (workstation) මුරපද ආරක්ෂාව කළමනාකරණය කිරීම (.........)

9. පහත වගන්ති අතුරින් 'පඨන මාත්‍ර මතකය (Read Only Memory - ROM)' පිළිබඳව සත්‍ය වගන්තිය කුමක් ද?
   (1) යෙදවුම් මෘදුකාංගවලට මෙම මතකයට දත්ත ඇතුළත් කිරීමට හැකිය.
   (2) පරිගණකය වසා දැමුව ද (switched off) ROM තුළ අන්තර්ගතය මැකී නොයයි.
   (3) වෙබ් පිටු බාගත (download) කරන අවස්ථාවේ ROM තුළ තැන්පත් කෙරේ.
   (4) පරිගණකය වසා දමන විට, ROM අන්තර්ගතය මැකී යයි. (.........)

[3 වැනි පිටුව බලන්න.

For More Past Papers
www.tamilguru.lk

2562

10. Zip ගොනුවක් යනු .... ගොනුවකි.
   (1) සංකුචිත (compressed) (2) පද්ධති (system)
   (3) වැඩසටහන් (program) (4) විධානීය (executable) (.........)

11. pen drive, thumb drive, key drive හෝ jump drive ආදී විවිධ නම්වලින් හැඳින්වෙන ...., එක් පරිගණකයක සිට ඡායාරූප වෙනත් පරිගණකයකට ගෙන යාමට ඇති අනර්ඝ ක්‍රමයකි.
   (1) සැණෙලි උපාංගය (USB flash drive) (2) දෘඪ ඩිස්කය
   (3) සංගත තැටිය (CD ROM) (4) DVD (.........)

12. අන්තර්ජාලය ක්‍රියාත්මක වන්නේ .... ප්‍රොටෝකෝලය මත ය.
   (1) http (2) ftp (3) tcp/ip (4) ip (.........)

13. http යනුවෙන් කෙටි කොට දැක්වෙන්නේ
   (1) hot text termination protocol. (2) high text transfer protocol.
   (3) hyper text transfer protocol. (4) high text termination protocol. (.........)

14. ප්‍රති-වෛරස මෘදුකාංගයක කාර්යයක් නොවන්නේ මින් කුමක් ද?
   (1) එය අන්තර්ජාලය තුළදී ආරක්ෂාව ඇති කරයි.
   (2) එමගින්, පරිගණකය වෙත පැමිණෙන සියලු ගොනු සුපරීක්ෂණය (scan) කරයි.
   (3) එමගින් ඔබේ පරිගණකය වෙත වෛරස ඇතුළුවීම වළකාලයි.
   (4) එමගින්, ගොනු බාගත කිරීම් වඩාත් කාර්යක්ෂම කරයි. (.........)

15. Facebook යනු .... ජාලයකි.
   (1) සන්නිවේදන (2) මෘදුකාංග (3) මාධ්‍ය (4) සමාජ (.........)

16. අනැවැසි ඊමේල් (junk email) පණිවුඩයක් යනු,
   (1) වෛරසයකි. (2) spam පණිවුඩයකි.
   (3) ඇමුණුමකි (attachment). (4) චිත්‍රපටයකි. (.........)

17. URL සම්බන්ධයෙන් සත්‍ය වන්නේ මින් කුමක් ද?
   (1) URL යනුවෙන් කෙටියෙන් දැක්වෙන්නේ 'Universal Resource Locator' යන්නයි.
   (2) එමගින් ගොනුවක, නාමාවලි මංපෙත (directory path) දක්වයි.
   (3) IP ලිපිනයට එහි සබඳතාවක් නැත.
   (4) URL භාවිත කරමින් අපට වෙබ් අඩවියකට පිවිසිය හැකිය. (.........)

18. සම්භාෂණය (Chatting) සඳහා භාවිත කළ නොහැක්කේ මින් කුමක් ද?
   (1) Google (2) Yahoo (3) Skype (4) Linux (.........)

19. 'WWW' යන්න සම්බන්ධයෙන් සත්‍ය වගන්තියක් නොවන්නේ මින් කුමක් ද?
   (1) වෙබ් ලිපිනයක් WWW යනුවෙන් ආරම්භ විය යුතුය.
   (2) එය වෙබ් පිටු මිලියන ගණනාවක එකතුවකි.
   (3) WWW යන්න වෙබ් ලිපිනයක කොතැනක හෝ අඩංගු විය හැකිය.
   (4) එහි වීඩියෝ සහ ශබ්ද ගොනු තිබිය හැකිය. (.........)

20. පහත කවරක් ඊමේල් පණිවුඩය තුළ ලිපිනය ප්‍රදර්ශනය නොකරම යම් ලබන්නකු වෙත යවන ඊමේල් පණිවුඩ පිටපතක් වන්නේ ද?
   (1) CC (2) To (3) BCC (4) Sender (.........)

For More Past Papers
www.tamilguru.lk

21. පද්ධති පරිපාලකගේ (system administrator) පරිගණකය වෙත අනවසරයෙන් ප්‍රවේශ වන පුද්ගලයකු විසින් ඇති කළ හැකි බරපතලම ගැටලුව වන්නේ,
    (1) උපස්ථ ලොග් (backup logs) තොරතුරු වෙත ප්‍රවේශවීම ය.
    (2) මුද්‍රණ යන්ත්‍ර ප්‍රවේශ සැකසුම් (access setting) වෙනස් කිරීම ය.
    (3) ඩෙක්ස්ටොප් පසුබිම වෙනස් කිරීම ය.
    (4) පද්ධති පරිපාලකගේ මුරපදය (password) වෙනස් කිරීම ය. (.........)

22. MSWord ලේඛනයකට ඇතුළත් කළ නොහැක්කේ මින් කුමක් ද?
    (1) බිටු සිතියම් අනුරූපකය (Bitmap image)
    (2) අධිසන්ධානය (Hyperlink)
    (3) ශීර්ෂකය (Header)
    (4) ඊමේල් පණිවුඩය (.........)

For More Past Papers
www.tamilguru.lk

23. පැතුරුම්පතක ඇතුළත් කොට ඇති දෛනික විකුණුම් දත්ත ඇසුරින් ප්‍රස්තාරයක්ද සහිතව දෛනික විකුණුම් පිළිබඳ වාර්තාවක් සකසන මෙන් ඔබේ අධ්‍යක්ෂවරයා ඔබට පවරයි. වාර්තාවෙහි, දිනපතා නවතම තොරතුරු ඇතුළත් වියයුතුය. මේ සඳහා ඔබ භාවිත කරන්නේ පහත කවරක් ද?
    (1) දිනපතා පැතුරුම්පතේ සිට ප්‍රස්තාර පිටපත් කර ඇලවීම
    (2) ප්‍රස්තාරයට අධිසන්ධානයක් යෙදීම (hyperlinking)
    (3) ස්වයංක්‍රීය ආනයනය (automated importing)
    (4) සන්ධානය සහ නිහිත කිරීම (linking and embedding) (.........)

24. MSWord ලේඛනයක් .... ලෙස සුරැකුම් කළ නොහැකිය.
    (1) වෙබ් පිටුවක් (2) XML ලේඛනයක්
    (3) සරල පාඨ (plain text) ලේඛනයක් (4) CSV ගොනුවක් (.........)

25. ඡේද අනුසලකුණ (paragraph mark) (¶) යනු, යතුරු පුවරුවේ .... යතුර තද කරන ලද්දේ ලේඛනයේ කවර ස්ථානවලදී ද යන්න දක්වන ආකෘතිකරණ සලකුණකි. (formatting mark)
    (1) tab key (2) space bar (3) enter key (4) shift key (.........)

26. MSWord හි අයිකනය භාවිත කෙරෙන්නේ,
    (1) තෝරාගත් පාඨයක අකුරුවල විශාලත්වය වැඩි කිරීමට ය.
    (2) තෝරාගත් අකුරක් මහකුරු (capital) කිරීමට ය.
    (3) කර්සරයට පසුව එන ඊළඟ වචනය තද පැහැ (bold) කිරීමට ය.
    (4) තෝරාගත් අකුරක් උඩුලකුණු (superscript) කිරීමට ය. (.........)

27. MSWord සම්බන්ධයෙන් සත්‍ය වගන්තිය මින් කුමක් ද?
    (1) MSWord ලේඛනයක, පේළි අංක (Line numbers) ඇතුළත් කළ නොහැකිය.
    (2) MSWord ලේඛනයේ ඕනෑම ස්ථානයකට පිටු කඩනයක් (Page break) ඇතුළත් කළ හැකිය.
    (3) MSWord ලේඛනයක අන්තර්ගතය, තීරු දෙකක් හෝ වැඩි ගණනකට වෙන් කළ නොහැකිය.
    (4) MSWord හි පිටු දිශානතීන් (page orientations) තුනක් ඇත. (.........)

28. පඨන මාත්‍ර (Read Only) ලෙස සකසා ඇති ලේඛනයක් සම්බන්ධයෙන් සාවද්‍ය වගන්තිය පහත කවරක් ද?
    (1) ඔබට එම ගොනුව කියවීමට හැකිය.
    (2) ඔබට එහි අන්තර්ගතය වෙනත් ගොනුවකට පිටපත් කළ හැකිය.
    (3) ඔබට එම ලේඛනයේ වෙනස්කම් කර සුරැකුම් (save) කළ හැකිය.
    (4) ඔබට එම ලේඛනය, අලුත් ගොනුවක් ලෙස සුරැකුම් කළ හැකිය. (.........)

29. ඔබට ලේඛනයක්, පොත් පිංචක් (booklet) ලෙස මුද්‍රණය කිරීමට අවශ්‍යව ඇතැයි උපකල්පනය කරන්න. මේ සඳහා වඩාත්ම ප්‍රයෝජනවත් වන්නේ පහත කවරක් ද?
   (1) print preview (2) page size (3) mirror margins (4) page border (………)

30. මෙම වැඩපතෙහි G6 කෝෂයේ ඇති සමීකරණය F5 කෝෂයට පිටපත් කරන ලද්දේ නම්, F5 හි සටහන් වන සමීකරණය වන්නේ,



   (1) =B1+$H2.
   (2) =A1+$H2.
   (3) =A2+$H3.
   (4) =B2+G2. (………)

31. MSExcel පැතුරුම්පතකට, ශ්‍රිතයක් (function) ඇතුළත් කිරීමට යොදා ගත හැකි කෙටිමං යතුරු සංකලනය මින් කුමක් ද?
   (1) shift+F1 (2) shift+F2 (3) shift+F3 (4) shift+F4 (………)

32. පහත වැඩපතෙහි C1 කෝෂයේ දිස්වන අගය කුමක් ද?



   (1) 0.6 (2) 0.66 (3) 0.667 (4) 0.67 (………)

33. A1=2 හා B1=0 බව ඔබට දී ඇත. C1 හි A1/B1 සමීකරණය ඇතුළත් කළහොත්, C1 හි දිස්වන්නේ කුමක් ද?
   (1) infinity (2) divide by zero (3) #DIV/0! (4) error (………)

34. MSExcel ගොනුවක් …………………………….. ලෙස සුරැකුම් කළ නොහැකිය.
   (1) වෙබ් පිටුවක් (2) XML ලේඛනයක්
   (3) MSWord ලේඛනයක් (4) අනුරූපකයක් (image) (………)

35. වැඩපතක A1 හි, "Selection test for programmers" යනුවෙන් ඇතුළත් කර ඇති අතර, පාඨ එතුම (wrap text) සිදුකර ඇත. මේ සම්බන්ධයෙන් පහත කවරක් සත්‍ය වේ ද?
   (1) සම්පූර්ණ පාඨය A1 තුළ පමණක් දර්ශනය වේ.
   (2) සෑම වචනයක් ම අලුත් පේළියක දර්ශනය වේ.
   (3) B1 හා C1 වලට ද මෙම පාඨය විහිදී දර්ශනය වේ.
   (4) පේළි උස අඩු වුවද සම්පූර්ණ පාඨයම එම කෝෂය තුළම දර්ශනය වේ. (………)

36. MSExcel වෙත නවකයකු A1, A3 හා A4 කෝෂවල පිළිවෙළින් 25, 10 හා 25 යන අගයන් ඇතුළත් කර ඇත. දැන් කෝෂ දක්වනය (cell pointer) A5 තුළ ඇත. ඔහු ඊළඟට AutoSum අයිකනය ක්ලික් කර Enter යතුර ඔබයි. කුමක් සිදුවනු ඇති ද?
   (1) කිසිවක් සිදු නොවනු ඇත. (2) A5 හි, 60 යන අගය දිස්වෙයි.
   (3) A5 හි, 35 යන අගය දිස්වෙයි. (4) A5 හි, 50 යන අගය දිස්වෙයි. (………)

37. MSExcel වැඩපතක A30 කෝෂය හිස්ව ඇති අතර, A31 කෝෂයෙහි =AVERAGE(A30) සමීකරණය ඇතුළත් කර ඇත. A31 කෝෂයේ MSExcel විසින් කුමක් පෙන්වයි ද?
   (1) #INFINITE (2) #ERROR (3) #DIV/0! (4) #VALUE! (………)

For More Past Papers
www.tamilguru.lk

38. MSExcel වැඩපතක, A1 හි "Selection Test" යැයි ද, A7 හි =A1+6 සමීකරණය ද ඇතුළත් කර ඇත. MSExcel විසින් A7 හි කවරක් පෙන්වයි ද?
    (1) #INFINITE (2) #ERROR (3) #DIV/0! (4) #VALUE! (.........)

39. ශිෂ්‍යයෙක්, MSExcel වැඩපතක වැඩ කරමින් සිටියේය. ඔහු වැඩපත අරඹන විට සියලු තීරුවල ශීර්ෂයන් (headings) අකාරාදි පිළිවෙළින් තිබිණි. කෙසේ වුවද මද වේලාවකින්, C හා D තීරු දර්ශනය නොවීය. මෙම තත්ත්වය ඇතිවීමට නම් ශිෂ්‍යයා පහත කවර ක්‍රියාවක් කරන්නට ඇති ද?
    (1) C හා D තීරු දෙකම මකා දමා ඇත. (deleted)
    (2) මෙම තීරු වෙනත් වැඩපතකට ගෙනගොස් ඇත.
    (3) ඔහු වැරදීමකින් මෙම තීරු ශීර්ෂ වෙනස් කර ඇත (renamed).
    (4) ඔහු වැරදීමකින් "Hide" විකල්පය තෝරා ඇත. (.........)

40. MSPowerPoint හි, ගුරු කදාව (slide master) සම්බන්ධයෙන් වන පහත වගන්ති සලකන්න.
    (a) ගුරු කදාව, කදා පිරිසැලසුම (slide layout) පිළිබඳ මූලික තොරතුරු ගබඩා කර ගනී.
    (b) ගුරු කදාව, සමර්පනයෙහි (presentation) සියලු කදාවන්ට එක සමාන පෙනුමක් ලබාදීමට ගත විය හැකි කාලය අඩු කරයි.
    (c) ඕනෑම සමර්පනයක අවම වශයෙන් එක් ගුරු කදාවක් හෝ අන්තර්ගත වියයුතුය.
    ඉහත වගන්තිවලින් කුමක් සත්‍ය වේ ද?
    (1) (a) හා (b) පමණි (2) (a) හා (c) පමණි
    (3) (b) හා (c) පමණි (4) (a), (b) හා (c) යන සියල්ලම (.........)

41. අකුරු රටා නිහිත කරමින් ම (font embedding) සමර්පනයක් ද, එහි මාධ්‍ය සන්ධානයන් ද (media links) බාහිර ආචයන උපාංගයක පිටපත් කළ හැකි ෆෝල්ඩරයක සුරැකුම් කළ හැක්කේ පහත කවරක් මගින් ද?
    (1) Publish slides (2) Package for CD
    (3) Add a digital signature (4) Encrypt (.........)

42. ඔබ සමර්පනයක කදා දැක්මෙහි (slide show) සිටින විට, ඔබ පෙර සිටි දැක්ම වෙත ආපසු යාම සඳහා භාවිත කළ හැක්කේ මින් කුමක් ද?
    (1) Enter යතුර (2) Home යතුර
    (3) ESC යතුර (4) මවුසයේ දකුණු බොත්තම (.........)

43. සමර්පනයක සිඟිති රූ දැක්ම (thumbnail presentation view) සම්බන්ධයෙන් සත්‍ය වන්නේ පහත කවරක් ද?
    (1) එහි කදා අනුපිළිවෙළ වෙනස් කළ නොහැකිය.
    (2) සමර්පනයක සිඟිති රූ දැක්මෙහි දී කදා මකා දැමිය නොහැකිය.
    (3) සමර්පනයක සිඟිති රූ දැක්මෙහිදී කදාවක අන්තර්ගතය වෙනස් කළ නොහැකිය.
    (4) සමර්පනයක සිඟිති රූ දැක්මේදී අලුතින් කදා ඇතුළු කිරීමට නොහැකි ය. (.........)

44. MSPowerPoint සම්බන්ධයෙන් පහත කවර වගන්තියක් සත්‍ය වේ ද?
    (1) කදා දැක්මේදී, ප්‍රේක්ෂකයාට සටහන් පිටු (notes pages) වල අන්තර්ගතය දර්ශනය වේ.
    (2) සටහන් පිටුවකට පින්තූර ඇතුළත් කළ හැකිය.
    (3) කදාවක් මත සෘජුවම ටයිප් කළ හැකිය.
    (4) තැන්දරණුවක් (placeholder) තුළ අකුරු ඇතුළත් කළ හැකිය. (.........)

45. MSPowerPoint හි කදා දැක්ම සම්බන්ධයෙන් පහත වගන්ති සලකන්න.
    (a) සමර්පනයෙහි පළමු කදාවේ සිටම කදා දැක්ම ඇරඹිය හැකිය.
    (b) සමර්පනයෙහි, ප්‍රවර්තන කදාවේ (current slide) සිටම කදා දැක්ම ඇරඹිය හැකිය.
    (c) කදා දැක්ම කවරාකාර වියයුතුද යන්න අපට වෙනස් කළ හැකිය.
    ඉහත කවරක් සත්‍ය වේ ද?
    (1) (a) හා (b) පමණි (2) (a) හා (c) පමණි
    (3) (b) හා (c) පමණි (4) (a), (b) හා (c) යන සියල්ලම (.........)

For More Past Papers
www.tamilguru.lk

46. දත්තපාදක කළමනාකරණ පද්ධතියක් නොවන්නේ මින් කුමක් ද?
(1) MySQL (2) Postgress (3) MSAccess (4) WAMP (.........)

47. දත්තපාදක වගුවක ඇති රෙකෝඩ ඒකීය වශයෙන් වෙන් කොට හඳුනා ගැනීම සඳහා භාවිත කළ හැකි ක්ෂේත්‍රය හඳුන්වන්නේ .... ලෙස ය.
(1) ප්‍රාථමික යතුර (Primary key) (2) ආගන්තුක යතුර (Foreign key)
(3) ව්‍යුත්පන්න යතුර (Alternate key) (4) සංයුක්ත යතුර (Composite key) (.........)

48. දත්තපාදකයන්හි SQL යනු .... ය.
(1) Strong Queue Language (2) Structured Query Language
(3) Simple Query Language (4) Simplex Query Language (.........)

49. දත්තපාදකයක් යනු වගු සමූහයක එකතුවක් නම්, වගුවක් යනු .... සමූහයක එකතුවකි.
(1) උපලක්ෂණ (attributes) (2) වසම් (domains)
(3) අගයයන් (values) (4) රෙකෝඩ(records) (.........)

50. පහත ලැයිස්තු අතුරින් චිත්‍රක ගොනු ආකෘති (graphic file formats) **පමණක්** ඇතුළත් වන්නේ කවරක් ද?
(1) GIF, JPEG, DIF (2) PNG, GIF, JPEG
(3) JPEG, TIFF, DIF (4) TIFF, DIF, PNG (.........)

● අංක **51** සිට **75** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු දී ඇති **තිත් ඉරි** මත ලියන්න.

51. 'පසුගාමී අනුකූලතාව (backward compatibility)' යන්නෙන් අදහස් වන්නේ කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

....

....

....

....

52. MSWord ලේඛනයකට MSPowerPoint සමර්පනයක් ඔබ ඇතුළත් කරන්නේ කෙසේ ද?

....

....

....

....

53. X^2 යන්න ටයිප් කිරීම සඳහා අනුගමනය කළ හැකි කෙටිම ක්‍රමය කුමක් ද?

....

....

....

....

54. MSWord ලේඛනයක ඇති වගුවක අවසන් පේළියේ අවසන් තීරුව තුළ කර්සරය ඇතැයි උපකල්පනය කරන්න. ඔබ ඊට යටින් අලුත් පේළියක් එක් කරන්නේ කෙසේ ද?

....

....

....

....

For More Past Papers
www.tamilguru.lk

55. MSWord ලේඛනයකට දියසලකුණක් (watermark) ඇතුළත් කරන්නේ කෙසේ දැයි කෙටියෙන් විස්තර කරන්න.

....

....

....

....

56. එක් ඡේදයකට ඔබ විසින් යොදා ඇති ආකෘතිකරණයක් (formatting) තවත් ඡේදයකට පිටපත් කරන්නේ කෙසේ දැයි සඳහන් කරන්න.

....

....

....

....

57. එකම MSWord ලේඛනයකට කර්තෘවරුන් කිහිපදෙනෙකු විසින් සිදු කරන ලද පරිශෝධනයන් ඒකාබද්ධ කරන්නේ කෙසේ දැයි විස්තර කරන්න.

....

....

....

....

58. පරිශෝධනය (revision) කරන ලද MSWord ලේඛනයක්, අවසන් වෙළුම බව ලේඛනයේ දැක්වීම සඳහා ක්‍රමයක් ඉදිරිපත් කරන්න.

....

....

....

....

59. MSWord ලේඛනයකට විවරණයක් (comment) ඇතුළත් කරන්නේ කෙසේ දැයි සඳහන් කරන්න.

....

....

....

....

60. MSWord ලේඛනයක, PDF ආකෘතියක් සකස් කරන්නේ කෙසේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

....

....

....

....

61. ඔබ MSExcel හි සමුද්දේශ ශෛලිය (reference style), R1C1 ශෛලියට වෙනස් කරන්නේ කෙසේද?

....

....

....

....

For More Past Papers
www.tamilguru.lk

62. සේවකයන් දහසකගේ දත්ත ඇතුළත් කළ MSExcel වැඩපතක, සේවකයාගේ නම ඔබ ඇතුළත් කර ඇත්තේ 1 රූපයේ ආකාරයට 'First Name' ලෙස A තීරුවේ හා 'Last Name' ලෙස B තීරුවේ යයි සිතන්න. මෙම තීරු දෙකේ දත්ත එක්කොට (concatenate) එම කොටස් අතර එක් ඉඩක් (space) තබා 2 රූපයේ දක්වා ඇති ආකාරයට සම්පූර්ණ නම C තීරුවේ ඇතුළත් කිරීමට ඔබට අවශ්‍යව ඇත. මෙයට ඔබ C4 හි ඇතුළත් කරන සමීකරණය ලියා දක්වන්න.

	A	B	C	D
1			ABC Company Ltd.	
2			Employee Details	
3	First Name	Last Name	Address Line 1	Address Line
4	Sithija	Siriwardhane		
5	Amalee	Meegasthanne		
6	Lakshman	Perera		

1 රූපය

	A	B	C	D	
1			ABC Company Ltd.		
2			Employee Details		
3	First Name	Last Name	Full Name	Address Line 1	Addr
4	Sithija	Siriwardhane	Sithija Siriwardhane		
5	Amalee	Meegasthanne			
6	Lakshman	Perera			

2 රූපය

....

63. A1 සහ B1 කෝෂවල ඇති දත්තයන්ගේ එකතුව ලබා ගැනීමට C1 හි සමීකරණයක් ඇතැයි ද, මෙහි දිස්වන අගය **පමණක්** D4 කෝෂය වෙත පිටපත් කළ යුතුව ඇතැයි ද උපකල්පනය කරන්න. ඔබ මෙය සිදු කරන්නේ කෙසේ දැයි විස්තර කරන්න.

....

....

....

....

64. වැඩපතක් අනුචලනය (scroll) කළ ද, එහි කොටසක් පමණක් ස්ථිරව තබා ගන්නේ කෙසේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

....

....

....

....

65. පැතුරුම් පතක වූ තීරුවක ඇති දත්ත ආරෝහණ පිළිවෙළට සකස් කරන්නේ කෙසේ දැයි කෙටියෙන් විස්තර කරන්න.

....

....

....

....

66. MSExcel වෙතට MSAccess දත්තපාදකයකින් දත්ත ආනයනය (import) කරන්නේ කෙසේ දැයි පියවරවලින් ලියන්න.

....

....

....

....

For More Past Papers
www.tamilguru.lk

[10 වැනි පිටුව බලන්න.

For More Past Papers
www.tamilguru.lk

67. ඔබ MSExcel ගොනුවක් CSV ගොනුවක්, ලෙස සුරැකුම් කරන්නේ කෙසේ දැයි විස්තර කරන්න.

....

....

....

....

68. සාපේක්ෂ සහ නිරපේක්ෂ කෝෂ සමුද්දේශ (Relative and Absolute cell references) යනු මොනවා දැයි එක් උදාහරණයක් බැගින් දෙමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

සාපේක්ෂ කෝෂ සමුද්දේශය :-

....

....

නිරපේක්ෂ කෝෂ සමුද්දේශය :-

....

....

69. MSExcel හි දී පාඨයක්, ආනත (diagonal) හෝ සිරස් (vartical) දිශානතියට භ්‍රමණය කිරීම සඳහා අනුගමනය කළයුතු පියවර ලියා දක්වන්න.

....

....

....

....

70. MSExcel හි ඇති ප්‍රස්තාර (chart) වර්ග **හතරක්** නම් කොට, එම එක් එක් වර්ගයෙහි ප්‍රයෝජන **එකක්** බැගින් ලියන්න.

....

....

....

....

71. 'සමමුහුර්තක අනුචලනය (synchronous scrolling)' යන්නෙන් කුමක් අදහස් වේ දැයි පැහැදිලි කරන්න.

....

....

....

....

72. MSAccess දත්ත පාදක වගුවක් සැකසීමේදී ඔබට යොදා ගත හැකි දත්ත ප්‍රරූප (data types) **හතරක්** සඳහන් කර, එම එක් එක් වර්ගය සඳහා උදාහරණ **එකක්** බැගින් සඳහන් කරන්න.

(i) ....

(ii) ....

(iii) ....

(iv) ....

For More Past Papers
www.tamilguru.lk

73. MSAccess දත්ත පාදක වගුවක් සැකසීමේදී ක්ෂේත්‍රයක් සඳහා යොදා ගන්නා ක්ෂේත්‍ර ලක්ෂණ (field properties) දෙකක් පහත දැක්වේ. ඒ එක් එක් ලක්ෂණයකින් දැක්වෙන්නේ කවරක් දැයි කෙටියෙන් දක්වන්න.

Format

....

....

Validation rule

....

....

74. MSAccess දත්තපාදකයක සම්බන්ධතා සටහන (relationship diagram) ලබා ගන්නේ කෙසේ දැයි ලියා දක්වන්න.

....

....

....

....

75. සරල ශිෂ්‍ය තොරතුරු පද්ධතියක් සඳහා 'Teacher' හා 'Student' භූතාර්ථ දෙක අතර භූතාර්ථ සම්බන්ධතා සටහනක් (Entity-Relationship diagram) ගොඩනගන විට, මෙම වගු දෙක අතර පවතින සම්බන්ධතාව ඒක-ඒක (one to one), ඒක-බහු (one to many) හා බහු-බහු (many to many) යන ආකාර අතුරින් කවර ආකාරයකට අයත් වේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

....

....

....

....

***

For More Past Papers
www.tamilguru.lk

2562

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වැනි පන්තියේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014(2015)

(ii) අභියෝග්‍යතාව

පැ. එකයි

විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.



✳ **පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**
1 2 3 4

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන පිටුවෙහි ඇති තිත් ඉර මත ද ලියන්න.

....

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

....

වැදගත් :

✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **08** කින් හා ප්‍රශ්න **50** කින් යුක්ත වේ.

✳ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.

✳ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය **පැය එකකි.**

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ **දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.**

✳ **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස **නිල් හෝ කළු** පෑනෙන් පමණක් ලියන්න. **පැන්සල් පාවිච්චි නොකරන්න.**

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ **අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

පිටුව	ප්‍රශ්න අංකය	ලැබූ ලකුණු
2	1 - 7	
3	8 - 17	
4	18 - 22	
5	23 - 30	
6	31 - 35	
7	36 - 45	
8	46 - 50	
එකතුව		

අවසාන ලකුණු

ඉලක්කමෙන්	
අකුරින්	

උත්තර පත්‍ර පරීක්ෂක	
ලකුණු පරීක්ෂා කළේ	

[2 වැනි පිටුව බලන්න.

For More Past Papers
www.tamilguru.lk

- අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ කිසියම් ගැටලුවක් සහ I හා II වශයෙන් වූ ප්‍රකාශ දෙකක් බැගින් දී ඇත. එම ප්‍රකාශ දෙක අතුරින්,
  - ✻ I ප්‍රකාශය පමණක් යොදාගෙන ගැටලුව විසඳිය හැකි වන්නේ නම් අංක **1** ද,
  - ✻ II ප්‍රකාශය පමණක් යොදාගෙන ගැටලුව විසඳිය හැකි වන්නේ නම් අංක **2** ද,
  - ✻ I හා II යන ප්‍රකාශ දෙකම එකට යොදාගෙන ගැටලුව විසඳිය හැකි වන්නේ නම් අංක **3** ද,
  - ✻ I හා II යන ප්‍රකාශ දෙකම වෙනවෙනම යොදාගෙන ගැටලුව විසඳිය හැකි වන්නේ නම් අංක **4** ද,
  - ✻ I හෝ II යන කිසිදු ප්‍රකාශයක් යොදාගෙන ගැටලුව විසඳිය හැකි නොවන්නේ නම් අංක **5** ද,

  එක් එක් ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න.

1. ගැටලුව : බෝගම්බර පැවැති මෝටර්රථ ධාවන තරගයේදී සිරිල්, අමල් හා විමල් යන තිදෙනා අතුරින් අඩුම කාලයකින් තරගය නිම කළේ කවරෙක් ද?

   ප්‍රකාශය : I. තරගය නිම කිරීමට විමල්ට වඩා වැඩි කාලයක් සිරිල්ට ගතවිය.

   II. අමල්ට වඩා අඩු කාලයකින් විමල් තරගය නිම කළේය. (………)

2. ගැටලුව : ආතර්, පීටර් හා නිහාල් නමැති සේවකයන් තිදෙනා අතුරින් වැඩිම වැටුප ලබන්නේ කවරෙක්ද?

   ප්‍රකාශය : I. පීටර්ට වඩා වැඩි වැටුපක් නිහාල් ද, නිහාල්ට වඩා අඩු වැටුපක් ආතර් ද ලබයි.

   II. නිහාල්ට වඩා අඩු වැටුපක් පීටර් ද, පීටර්ට වඩා වැඩි වැටුපක් ආතර් ද ලබයි. (………)

3. ගැටලුව : බාලිකා විද්‍යාලයේ පැවැති නිවාසාන්තර ක්‍රීඩා තරගයේදී ඕලු, මානෙල්, නෙලුම් හා කුමුදු යන නිවාස අතුරින් ජයග්‍රාහී නිවාසය කුමක් ද?

   ප්‍රකාශය : I. ඕලු නිවාසයට වඩා අඩු ලකුණු සංඛ්‍යාවක් මානෙල් නිවාසය විසින් ලබාගෙන තිබේ.

   II. නෙලුම් නිවාසයට වඩා වැඩි ලකුණු සංඛ්‍යාවක් කුමුදු නිවාසය විසින් ලබාගෙන තිබේ. (………)

4. ගැටලුව : හෝටලයේ වැඩියෙන්ම ආප්ප සාදන්නේ සඳුදා, බදාදා හා සිකුරාදා යන දවස් තුන අතුරින් කවදා ද?

   ප්‍රකාශය : I. සිකුරාදාට වඩා අඩු ආප්ප සංඛ්‍යාවක් සඳුදාටද, සඳුදාට වඩා වැඩි ආප්ප සංඛ්‍යාවක් බදාදාටද සාදයි.

   II. සඳුදා හා බදාදා යන දවස් දෙකේම සාදන ආප්ප සංඛ්‍යාවේ එකතුවට සමාන ආප්ප සංඛ්‍යාවක් සිකුරාදාට සාදයි. (………)

5. ගැටලුව : සමචතුරස්‍රාකාර පන්ති කාමරයේ බිම සම්පූර්ණයෙන් වැසෙන සේ ඇතිරීම සඳහා අවශ්‍ය වන 30 cm× 30 cm ප්‍රමාණයේ පිඟන් ගඩොල් සංඛ්‍යාව කොපමණ ද?

   ප්‍රකාශය : I. පන්ති කාමරයෙහි පරිමිතිය මීටර 80 කි.

   II. පන්ති කාමර බිමෙහි වර්ගඵලය වර්ගමීටර 400 කි. (………)

- අංක **6** සිට **8** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ ඉංග්‍රීසි වචන තුනක් බැගින් කිසියම් රහස් අංකන ක්‍රමයකට අනුව දක්වා ඇත්තේ, ඒවායේ ඇතුළත් එක් එක් අක්ෂරය නියෝජනය කරනු ලබන ඉලක්කම නිවැරදි අනුපිළිවෙළින් පිහිටන පරිදි නොවේ. මෙහිදී ඒ ඒ අක්ෂරය නියෝජනය කරනු ලබන ඉලක්කම ප්‍රශ්නයෙන් ප්‍රශ්නයට වෙනස් විය හැකිය.

  එම රහස් අංකන ක්‍රමයට අනුව **තද කළු අකුරින් මුද්‍රිත** ඉංග්‍රීසි වචනය නිරූපණය කළ හැකි ඉලක්කම් කාණ්ඩයක් නිවැරදි අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

6. *SHRIFT* - 643512   *PETIT* - 86746   *SPEED* - 18789

   SPRIT

   (1) 17246   (2) 17426   (3) 17645   (4) 17864   (………)

7. *SOLID* - 20631   *LATER* - 64578   *WORDS* - 90812

   AWARDS

   (1) 292751   (2) 494812   (3) 494831   (4) 949721   (………)

8. *BARBER* - 214254 *CANNON* - 303356 *EDIBLE* - 194871
DANCER

(1) 216537 (2) 735612 (3) 753612 (4) 756321 (.........)

- අංක **9** සිට **12** තෙක් ප්‍රශ්න, එක්තරා සතරමංසන්ධියකට පැමිණි මිතුරන් හය දෙනෙකු ගමන් කළ දිශා සම්බන්ධයෙන් වන පහත තොරතුරු මත පදනම් වේ.

  ✤ අමල්, විමල්, කමල්, සුනිල්, අනිල් හා දිනිල් නමැති මිතුරන් හය දෙනෙකු එක් වරකට දෙදෙනා බැගින් අවස්ථා තුනකදී උතුර, දකුණ, බටහිර හා නැගෙනහිර යන දිශාවන්ට විහිදුණු මාර්ග සහිත සතර මංසන්ධියකට එකම දිශාවක සිට පැමිණ පහත දැක්වෙන පරිදි එක් එක් දිශාවට ගමන් කළහ.

  ⁕ අමල් සමග පැමිණි මිතුරා නැගෙනහිර දිශාවට ගමන් කළේය.
  ⁕ සුනිල් උතුරු දිශාවට ගමන් කළේය.
  ⁕ විමල් සමග පැමිණි මිතුරා බටහිර දිශාවට ගමන් කළේය.
  ⁕ කමල් හා අමල් එකිනෙකට ප්‍රතිවිරුද්ධ දිශා දෙකකට ගමන් කළහ.

  ✤ මෙහිදී එකම අවස්ථාවකදී සතරමං සන්ධියට පැමිණි සෑම මිතුරන් දෙදෙනෙකුම අනිවාර්යයෙන් එකිනෙකාට ප්‍රතිවිරුද්ධ දිශාවලට ගමන් කළහ.

මෙම තොරතුරුවලට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

9. දිනිල් ගමන් කළ දිශාව විය හැක්කේ මින් කුමක් ද?
   (1) උතුර හෝ නැගෙනහිර (2) උතුර හෝ බටහිර
   (3) දකුණ හෝ නැගෙනහිර (4) දකුණ හෝ බටහිර (.........)

10. එකම දිශාවට ගමන් කළ මිතුරන් දෙදෙනෙකු වන්නේ නිශ්චිතවම පහත කවරහු ද?
   (1) අමල් හා අනිල් (2) විමල් හා කමල් (3) අනිල් හා දිනිල් (4) දිනිල් හා අමල් (.........)

11. දකුණු දිශාවට ගමන් කළ මිතුරා සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශය මින් කුමක් ද?
   (1) නිශ්චිතවම අනිල් වේ. (2) නිශ්චිතවම දිනිල් වේ.
   (3) අනිල් හෝ දිනිල් වේ. (4) අනිල් හෝ දිනිල් නොවේ. (.........)

12. එකම අවස්ථාවකදී සතරමං සන්ධියට පැමිණි මිතුරන් දෙදෙනෙකු විය **නොහැක්කේ** මින් කවරහු ද?
   (1) අනිල් හා දිනිල් (2) අමල් හා විමල් (3) අමල් හා කමල් (4) සුනිල් හා දිනිල් (.........)

- අංක **13** සිට **17** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ කිසියම් රටාවකට අනුව පෙළගස්වන ලද සංඛ්‍යා පේළියක් බැගින් දී ඇත. එම එක් එක් රටාවට අනුව **?** සලකුණ සහිත ස්ථානයට යෙදීමට වඩාත්ම සුදුසු සංඛ්‍යාව තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

13. 720 , 180 , 60 , 30 , ...**?**....
   (1) 10 (2) 15 (3) 20 (4) 30 (.........)

14. 3 , 9 , 54 , 648 , ...**?**....
   (1) 3888 (2) 7776 (3) 11664 (4) 15552 (.........)

15. 65 , 50 , 36 , 23 , ...**?**....
   (1) 11 (2) 12 (3) 13 (4) 14 (.........)

16. 9 , 28 , 65 , 126 , ...**?**....
   (1) 164 (2) 184 (3) 217 (4) 245 (.........)

17. 19 , 30 , 40 , 51 , ...**?**....
   (1) 60 (2) 61 (3) 62 (4) 63 (.........)

For More Past Papers
www.tamilguru.lk

● අංක **18** සිට **20** තෙක් ප්‍රශ්න, වෘත්ත තුනකින් සමන්විත පහත දැක්වෙන වෘත්ත ජාලය හා ඒ සම්බන්ධයෙන් වන තොරතුරු මත පදනම් වේ.



✳ මෙම වෘත්ත ජාලයේ ඇතුළත් සෑම වෘත්තයක්ම සමාන කොටස් අටකට බෙදා 1 සිට 8 තෙක් සංඛ්‍යා යොදා අංකනය කර ඇත.

✳ ***A*, *B*** හා ***C*** යන ඉංග්‍රීසි අක්ෂර සහිත ප්‍රදේශ තුළද සංඛ්‍යා යොදා අංකනය කරන ලද කිසියම් ජාල කොටසක් බැගින් පිහිටයි.

මෙම තොරතුරුවලට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

18. ***A*** ප්‍රදේශය තුළ පිහිටන ජාල කොටසක් විය හැක්කේ මින් කුමක් ද?



(1) (2) (3) (4) (.........)

19. ***B*** ප්‍රදේශය තුළ පිහිටන ජාල කොටසක් විය හැක්කේ මින් කුමක් ද?

(1) (2) (3) (4) (.........)

20. ***C*** ප්‍රදේශය තුළ පිහිටන ජාල කොටසක් විය හැක්කේ මින් කුමක් ද?



(1) (2) (3) (4) (.........)

● අංක **21** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

21. එක්තරා ගමක පිහිටා ඇති පන්සලක, පල්ලියක, හා කෝවිලක සීනු පිළිවෙළින් සෑම මිනිත්තු 20 කටම, මිනිත්තු 30 කටම හා මිනිත්තු 45 කටම වරක් බැගින් ගමට ඇසෙන සේ නාදකරනු ලබයි. එක්තරා දිනයකදී පස්වරු 6.00 ට මෙම සීනු තුනම එකවර නාද කරනු ලැබුවේ නම්, නැවතත් එම සීනු තුනම එකවර නාද කරනු ලබන්නේ කීයට ද?

(1) රාත්‍රී 9.00 ට (2) රාත්‍රී 10.00 ට (3) රාත්‍රී 11.00 ට (4) රාත්‍රී 12.00 ට (.........)

22. සමචතුරස්‍රාකාර ඉඩමක් වටා වැටක් ඉදිකිරීම සඳහා සමාන පරතරයකින් යුතුව කම්බි කණු 100 ක් සිටුවා ඇත. මෙම ඉඩම වටා පරිමිතිය මීටර 900 ක් නම්, සිටුවා ඇති කම්බි කණු දෙකක් අතර පරතරය මීටර කීය ද?

(1) 8 (2) 9 (3) 10 (4) 11 (.........)

For More Past Papers
www.tamilguru.lk

23. කවාකාරව සිටගෙන සිටින ළමුන් කණ්ඩායමක්, එක ළමයෙකුගෙන් පටන්ගෙන වමේ සිට දකුණට පිළිවෙළින් එක, දෙක, තුන යනාදි වශයෙන් හඬනගා ගණන් කරයි. එහිදී හතරවැන්නා, 'හතර' යන්න කියන විට පස්වැන්නාට එය 'හත' ලෙස ඇසුණු නිසා ඔහු 'අට' ලෙස හඬ නගා කියයි. එතැන් සිට එම අනුපිළිවෙළටම දිගටම ගණන් කළ අතර නැවත හතරවැන්නා ළඟට එනවිට 'හතලිස් හතර' යැයි ඔහු හඬනගා ප්‍රකාශ කරයි. එසේ නම්, එම කණ්ඩායමෙහි සිටින මුළු ළමුන් සංඛ්‍යාව කීය ද?

(1) 37 (2) 38 (3) 39 (4) 40 (.........)

24. රඹුටන් වෙළෙන්දෙකු සමාන ගෙඩි සංඛ්‍යාවක් ඇති රඹුටන් ඉති, එම එක් ඉත්තක ඇති ගෙඩි සංඛ්‍යාවට සමාන ඉති සංඛ්‍යාවක් සමග එකට ගැටගසා රඹුටන් පොකුරු ලෙස අලෙවියට සූදානම් කර ඇත. එසේ සූදානම් කර තිබූ එක් රඹුටන් පොකුරක 60 ට වැඩි හා 80 ට අඩු ගෙඩි සංඛ්‍යාවක් ඇතුළත් වී තිබුණේ නම්, එම පොකුරේ එක් ඉත්තක අඩංගුවී තිබුණු රඹුටන් ගෙඩි සංඛ්‍යාව කීයක් වන්නට ඇත්ද?

(1) 6 (2) 7 (3) 8 (4) 9 (.........)

25. තුෂාර ළඟ ලිපිගොනු කවර 27 ක් තිබේ. ඒවා රතු හෝ කහ හෝ නිල් පැහැති වේ. එහි ඇති රතු පැහැති ලිපිගොනු කවර සංඛ්‍යාව, නිල්පැහැති ලිපිගොනු කවර සංඛ්‍යාව මෙන් දෙගුණයකි. එමෙන්ම කහපැහැති ලිපිගොනු කවර සංඛ්‍යාව, රතුපැහැති ලිපිගොනු කවර සංඛ්‍යාව මෙන් තුන් ගුණයකි. එසේ නම්, ඔහු ළඟ ඇති කහපැහැති ලිපිගොනු කවර සංඛ්‍යාව කීය ද?

(1) 9 (2) 12 (3) 15 (4) 18 (.........)

- අංක **26** සිට **30** තෙක් ප්‍රශ්න, එක්තරා පන්තියක සිටින ඉංග්‍රීසි, ප්‍රංශ, දෙමළ හා ජර්මන් යන භාෂා හතර හදාරනු ලබන ශිෂ්‍ය සංඛ්‍යා නිරූපණය කෙරෙන පහත රූප සටහන මත පදනම් වේ.



මෙම තොරතුරුවලට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

26. වැඩිම ශිෂ්‍ය සංඛ්‍යාවක් විසින් හදාරනු ලබන භාෂාව මින් කුමක් ද?

(1) ඉංග්‍රීසි (2) දෙමළ (3) ප්‍රංශ (4) ජර්මන් (.........)

27. යටත් පිරිසෙයින් භාෂා තුනක්වත් හදාරනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණ ද?

(1) 5 (2) 10 (3) 14 (4) 16 (.........)

28. දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා හදාරන නමුත් ප්‍රංශ භාෂාව **හදාරනු නොලබන** ශිෂ්‍ය සංඛ්‍යාව කීය ද?

(1) 4 (2) 5 (3) 7 (4) 9 (.........)

29. ජර්මන් භාෂාව සමග තවත් එක් භාෂාවක් පමණක් හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණ ද?

(1) 5 (2) 8 (3) 13 (4) 17 (.........)

30. භාෂා දෙකක් පමණක් හදාරන ශිෂ්‍ය කණ්ඩායම් අතුරින්, කිසිම ශිෂ්‍යයකු ඇතුළත් **නොවන්නේ** මින් කුමන භාෂා දෙක හදාරන ශිෂ්‍ය කණ්ඩායමට ද?

(1) ප්‍රංශ හා ඉංග්‍රීසි (2) දෙමළ හා ඉංග්‍රීසි
(3) ජර්මන් හා ප්‍රංශ (4) ඉංග්‍රීසි හා ජර්මන් (.........)

For More Past Papers
www.tamilguru.lk

- අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ කිසියම් ඝනකයක එක්තරා පිහිටීමක් බැගින් දී ඇත. එම පිහිටීම ලබාගත හැකි ඝනකය පිළියෙල කිරීම සඳහා යොදා ගත හැකි ඝනක පතරොම තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

31.


(1)

(2)

(3)

(4)
(.........)

32.


(1)

(2)

(3)

(4)
(.........)

33.


(1)

(2)

(3)

(4)
(.........)

34.


(1)

(2)

(3)

(4)
(.........)

35.


(1)

(2)

(3)

(4)
(.........)

For More Past Papers
www.tamilguru.lk

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්න, ***A, B, C, D, E*** හා ***F*** නමැති කාර්යාල සේවකයන් හයදෙනෙකුගේ වයස් සම්බන්ධයෙන් වන පහත තොරතුරු මත පදනම් වේ.

  ✻ ***A*** ගේ වයස, ***C*** ගේ වයසට වඩා අවුරුදු 5 කින් වැඩිය.

  ✻ ***B*** ගේ වයස, ***E*** ගේ වයස මෙන් දෙගුණයකි.

  ✻ ***A*** ගේ හා ***E*** ගේ වයස්වල එකතුව අවුරුදු 55 කි.

  ✻ ***B*** ගේ හා ***C*** ගේ වයස්වල එකතුව අවුරුදු 71 කි.

  ✻ ***F*** ගේ වයස, ***A*** ගේ හා ***B*** ගේ වයස්වල එකතුවෙන් හරි අඩකි.

  ✻ ***B*** ගේ වයස, ***D*** ගේ හා ***F*** ගේ වයස්වල එකතුවෙන් හරි අඩකි.

  මෙම තොරතුරුවලට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න.

36. ***A*** ගේ හා ***B*** ගේ වයස් අනුපිළිවෙළින් අවුරුදු කීයක් බැගින් වේ ද?
    (1) 30, 36 (2) 32, 40 (3) 34, 42 (4) 36, 44 (.........)

37. ***C*** ගේ හා ***D*** ගේ වයස් අතර පරතරය අවුරුදු කීයද?
    (1) 8 (2) 11 (3) 14 (4) 17 (.........)

38. වයසින් වැඩිමහල්ම තැනැත්තා කවරෙක් ද?
    (1) ***B*** (2) ***D*** (3) ***E*** (4) ***F*** (.........)

39. ***E*** ගේ හා ***F*** ගේ වයස්වල එකතුව අවුරුදු කීයද?
    (1) 59 (2) 67 (3) 75 (4) 80 (.........)

40. වයසින් බාලම තැනැත්තා කවරෙක් ද?
    (1) ***B*** (2) ***D*** (3) ***E*** (4) ***F*** (.........)

- අංක **41** සිට **45** තෙක් ප්‍රශ්න, කිසියම් රටාවකට අනුව සංඛ්‍යා යොදන ලද පහත දී ඇති සංඛ්‍යා චක්‍රය හා ඒ සම්බන්ධයෙන් වන තොරතුරු මත පදනම් වේ.



  ✻ සංඛ්‍යා චක්‍රයේ ***A, B, C, D*** හා ***E*** යන එක් එක් ඉංග්‍රීසි අක්ෂරය මගින් දක්වා ඇති ඒ ඒ ස්ථානයට ද එම රටාවට අනුකූලවන සේ කිසියම් සංඛ්‍යාවක් බැගින් යෙදේ.

  මෙම තොරතුරුවලට අනුව පහත එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති එක් එක් ඉංග්‍රීසි අක්ෂරය සහිත ස්ථානයට යෙදෙන සංඛ්‍යාව සොයා, එම **සංඛ්‍යාව** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත **ඉලක්කමෙන් පමණක්** ලියන්න.

41. ***A*** (.........)

42. ***B*** (.........)

43. ***C*** (.........)

44. ***D*** (.........)

45. ***E*** (.........)

[8 වැනි පිටුව බලන්න.

For More Past Papers
www.tamilguru.lk

- අංක **46** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර සොයා, එම පිළිතුර ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ඉලක්කමෙන් පමණක් ලියන්න.

46. මෙම රූපයේ ඇති චතුරස්‍ර සංඛ්‍යාව කීයද?



(.........)

47. ප්‍රශ්න 50 කින් යුත් එක්තරා බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍රයක් සඳහා සපයනු ලබන සෑම නිවැරදි පිළිතුරකටම ලකුණු 3 ක් බැගින් ලබා දෙන අතර සෑම වැරදි පිළිතුරකටම ලකුණු 1 ක් බැගින් අඩු කරනු ලැබේ. එම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 50 ටම පිළිතුරු සැපයූ තාරකට ලබාගත හැකි වූ මුළු ලකුණු සංඛ්‍යාව 78 කි. එසේනම්, තාරක විසින් නිවැරදිව පිළිතුරු සපයන ලද ප්‍රශ්න සංඛ්‍යාව කීයද? (.........)

48. රූපවාහිනී යන්ත්‍රයක් අත්පිට මුදලට විකිණීමේ දී එහි ලකුණු කළ මිලෙන් 10% ක වට්ටමක් ලබාදෙන අතර විකුණුම් මිලෙන් 12% ක් වැට් බදු වශයෙන් අය කෙරේ. මෙම වර්ගයේ රූපවාහිනි යන්ත්‍රයක් අත්පිට මුදලට මිලදී ගත් තැනැත්තෙකුට රුපියල් 15 120ක මුදලක් ගෙවීමට සිදුවූයේ නම්, එම රූපවාහිනි යන්ත්‍රයේ ලකුණු කළ මිල රුපියල් කීයද? (.........)

49. මීටර 6 ක් දිග කම්බියක බර කිලෝග්‍රෑම් 10. 8 කි. මීටර 10 ක් දිග එම වර්ගයේම කම්බියක බර කිලෝග්‍රෑම් කීයක් විය හැකිද? (.........)

50. එක්තරා පන්තියක ඉගෙනුම ලබන සෑම සිසුවෙක්ම සංගීතය හෝ නැටුම් හෝ එම විෂයන් දෙකම හෝ හදාරනු ලබයි. එම පන්තියේ නැටුම් හා සංගීතය යන විෂයන් දෙකම හදාරන සිසුහු 8 දෙනෙක් සිටිති. එමෙන්ම සංගීතය හදාරන්නේ සිසුන් 18 දෙනෙකි. නැටුම් පමණක් හදාරන්නේ සිසුන් 12 දෙනෙකි. එසේනම්, එම පන්තියේ සිටින මුළු සිසුන් සංඛ්‍යාව කීයද? (.........)

* * *

For More Past Papers
www.tamilguru.lk